# තනි පද - 9

***වචන කිහිපයක් වෙනුවට යෙදිය හැකි තනි වචන තනි පද නම් වේ***

*උදා :-* අනුන් ගැන සිතන්නා - පරාර්ථකාමී

1) මරණයට කැපවූවෙක් නිදහස් කිරීම - අභයදානය
2) මැටි කර්මාන්තයේ යෙදුණු - කුඹල්
3) මුහුදෙහි ඇති ජලය - කරදිය
4) ඇළ, දොළ, වැව්, පොකුණුවල ඇති ජලය - මිරිදිය
5) ධර්මානුකූලව කටයුතු කරන්නා - ධර්මිෂ්ඨ
6) විද්‍යාත්මක පරීක්ෂණ පවත්වන ස්ථානය - රසායනාගාරය
7) පුරා වස්තු තැන්පත් කර ඇති ස්ථානය - කෞතුකාගාරය
8) මළ සිරුරු දවන ස්ථානය - ආදාහනාගාරය
9) මළ සිරුරක් දැවූ පසු ඉතිරි වන අළු - භෂ්මාවශේෂ
10) කිසිදා නොමැරෙන - අජරාමර
11) වනයෙහි හැසිරෙන - වනචාරී
12) කිසිවෙකුටත් හිංසාවක් නොකරන - අහිංසක
13) ගොයම් කපාගත් පසු කුඹුරේ ඉතිරිවන කොටස - ඉපනැල්ල
14) හිරු උදාවට පෙර දැකිය හැකි ආලෝකය - අරුණළු
15) වැවක ජලය බැස යාමට ඇති ස්ථානය - සොරොව්ව
16) උසාවියක නඩු විසඳන තැනැත්තා - විනිශ්චයකරු
17) අනුන්ගේ සැප සම්පත් බලා නොසතුටුවීම - ඊර්ෂ්‍යාව
18) කථා කිරීමෙහි ඇති හැකියාව - කථිකත්වය
19) මුල සිට අග දක්වා වැඩිවන ආකාරයට - අනුලෝම
20) අග සිට මුල දක්වා අඩුවන ආකාරයට - ප්‍රතිලෝම

The National e-learning portal for the General Education